# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2307/64 - 2022 නොවැම්බර් මස 25 වැනි සිකුරාදා - 2022.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KDS/AKU/4/2/1/93.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය*: 4-3/8/2017/PC/263.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධන පනතින් (සංශෝධිත) පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 575 දරන රතුකොහො ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පන්ගොල්ලාමඩ ගමෙහි පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කර අනුමත කරන ලද, 2022.08.31 වැනි දිනැති අංක මහ 7148 දරන මූලික පිඹුරේ, කැබලි අංක 1, 2, වශයෙන් දැක්වෙන, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0422ක් පමණ වන හීපිටිය වත්ත නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස්

**කැබලි අංක 1**

ඉඩමේ නම: හීපිටියවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර්: 0.0261
ඉඩමේ මායිම්:

*උතුරට*: ඒ. එම්. ජී. අමරකෝන් හිමිකම් කියන හීපිටිය වත්ත සහ මු.පි. A 403 හි කැබලි අංක 1; *නැගෙනහිරට* : මු.පි A 403 හි කැබලි අංක 1; *දකුණට* : මු.පි A 403 හි කැබලි අංක 1 මාර්ගය; බටහිරට: අබ්දුල් කාදර් ලෙබ්බේ හිමිකම් කියන හීපිටියවත්ත සහ ඒ. එම්. ජී. අමරකෝන් හිමිකම් කියන හීපිටියවත්ත,

**හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන් :**

01 එච්. එම්. එම්. ඒ. කාදර් මහතා, අංක -233, පන්ගොල්ලාමඩ, රතුකොහො, දිගල.

**කැබලි අංක 2**

ඉඩමේ නම: හීපිටියවත්ත; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර්: 0.0161

*උතුරට*: අයි. එම්. යුසුෆ් හිමිකම් කියන හීපිටියවත්ත සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ; *නැගෙනහිරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ; *දකුණට* : මු. පි. 403හි කැබලි අංක 1; බටහිරට : මු. පි. 403 හි කැබලි අංක 1 සහ අයි.එම්. යුසුෆ් හිමිකම් කියන හීපිටිය වත්ත.

**හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන් :**

එම්. එච්. ඒ. මජීඩ් මහතා, අංක 224/4, හීපිටිය, පන්ගොල්ලාමඩ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.01.11 වැනි දින පෙ. ව. 10.00 ට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2023 ජනවාරි මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2022 නොවැම්බර් මස 22 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0301

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: THI/LND/L2/ACQVI/147.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය*: 4-3/12/2018/WS/257.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 349 බී, කිතලගම මධ්‍යම ග්‍රාම නිලධාරි වසමට අයත් කිතලගම ගමේ පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් පිළියෙල කරන ලද, 2022.08.31 දිනැති හා අවසාන ගම් පිඹුරු අංක මු. පි. මාර 2890 හි කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0736 ක් වූ පහත සඳහන් ඉඩම්.

**කැබලි අංක 01**

ඉඩමේ නම: උඩහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ඉදිකරමින් පවතින වතුර ටැංකියක කොටසක් සහ අවු. 30-40 පමණ වයසැති කුරුඳු වගාවක් ඇත; ප්‍රමාණය හෙක්ටයාර්: 0.0763

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2022.12.28 වැනි දින පෙරවරු 10.00ට තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය. තවද, 2022.12.19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

.

උමේෂා මාතරගේ
ප්‍රාදේශීය ලේකම්/ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,

2022 නොවැම්බර් මස 21 වැනි දින
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

EOG 11 - 0302

---

## ශුද්ධි පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

උක්ත ශීර්ෂය යටතේ අංක 1106/15 හා 1999.11.15 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* මා විසින් පළ කරන ලද දැන්වීමෙහි සඳහන් ඉඩම් කැබලි පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. **කැබලි අංකය** 03
ඉඩමේ නම: නුගේතුඩුව; වත්ත; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0034

2. **කැබලි අංකය** 04
ඉඩමේ නම: නුගේතුඩුව වත්ත; විස්තරය: ගෙවත්ත; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0003

එම්. ජී. හසන්ති නිරෝෂනී,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්ගොඩ.

2022 නොවැම්බර් මස 22 වැනි දින,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0303

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.